*සැ. යු.* — 2015.01.02 දින පළ වූ අංක 1,896 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (*අ*) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,897 - 2015 ජනවාරි මස 09 වැනි සිකුරාදා - 2015.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 10 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 10 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජනවාරි මස 30 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

9 - B 80908— 302 (2015/01)
D 1 -

# නොතාරිස් ලැයිස්තුව

**නොතාරිස් ආඥාපනත (නොතාරිස් බලපත්‍රය බලාත්මක කිරීම)**

අංක 1,876 හා 2014.08.15 දිනැති *ගැසට් නිවේදනය* මඟින් 2014.05.21 දින සිට නොතාරිස් ධූරයේ කටයුතු කිරීම අත්හිටුවන ලද ගජසිංහගේ රුක්මන් චන්දන සිල්වා මහතාගේ, ගම්පහ අධිකරණ කලාපයට අයත් අංක 15,250 හා 2007.04.11 දිනැති සිංහල භාෂාවෙන් වූ නොතාරිස් බලපත්‍රය, නොතාරිස් ආඥාපනතේ 19(1) වගන්තිය යටතේ ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් 2014.05.21 වැනි දින සිට නැවත බලාත්මක කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

පී. බී. අබේකෝන්,
ලේකම්.
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2014 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

01-316

---

# විවිධ දැන්වීම්

**රවීචන්ද්‍ර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

ගරු සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ වන මම ප්‍රකාශ කර දැනුම් දෙන වගනම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 48 යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන "රවීචන්ද්‍ර පදනම සංස්ථාගත කිරීමේ පනත" පහත සඳහන් සාමාන්‍ය විෂයන්ගෙන් සමන්විත වේ.

(1) හෙළ උරුමයන්, අපගේ අනන්‍ය සංස්කෘතීන් වර්ධනය සහ පෝෂණය කිරීමට අදාල ආයතනවලට සහය දැක්වීම,

(2) ඉහත 1 ක්‍රියාත්මක කිරීම තුලින් නවෝත්පාදන බිහි කිරීම, නව නිර්මාණ බිහි කිරීම සහ එම ක්ෂේත්‍රයන් තුළ ස්වයං රැකියා උත්පාදනය කිරීම සඳහා අදාල ආයතනවලට සහය දැක්වීම

(3) ශ්‍රී ලාංකීය සංස්කෘතිය රැකෙන පරිදි කෙරෙන නිෂ්පාදනවලට වෙළඳපොලේ සාධාරණ මිලක් ලබා දීම තුලින් එම නිෂ්පාදනකරුවන්ගේ වෘත්තීන් ආරක්ෂා කිරීම සඳහා අදාල ආයතන වලට සහාය දැක්වීම,

සහ වෙනත්.

ගරු සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ගම්පහ දිස්ත්‍රික්කය.

01-267

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.